සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

# වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2020
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය | පත්‍රය / வினாத்தாள் / Paper: I | කාලය / காலம் / Time: පැය 01 |

සැලකිය යුතුයි:
(i) අංක 01 සිට 40 දක්වා ඇති සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

- **පහත සිද්ධිය ඇසුරෙන් ප්‍රශ්න අංක 01 සිට 04 දක්වා පිළිතුරු සපයන්න.**

⋆ නවීන තාක්ෂණික ක්‍රම උපයෝගී කරගෙන කාබනික පොහොර නිෂ්පාදනය පිළිබඳ විශේෂ පුහුණුවක් ලබා ඇති 'අරංගල' ඉවතලන ද්‍රව්‍ය භාවිතයෙන් කාබනික පොහොර නිෂ්පාදනය කරයි. ප්‍රමාණවත් ඉඩම් හිමියෙකු වන ඇය ව්‍යාපාරික වශයෙන් කාබනික පොහොර නිපදවන්නීය. එළවළු හා මල් වගා කරන ප්‍රදේශයක මෙම නිෂ්පාදනාගාරය පිහිටුවා තිබීම ඇයට වාසිදායක විය.

(01) මෙම සිද්ධියේ සඳහන් අරංගලගේ ව්‍යාපාරය,
(1) භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාරයකි.
(2) සේවා සපයන ව්‍යාපාරයකි.
(3) හවුල් ව්‍යාපාරයකි.
(4) ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාරයකි.

(02) අරංගලගේ ව්‍යාපාරයේ ශක්තියක් වන්නේ,
(1) අරංගල විශේෂ පුහුණුවක් ලබා තිබීම ය.
(2) අරංගලට ඉලක්ක වෙළෙඳපොළක් පැවතීම ය.
(3) අවට ඉවතලන ද්‍රව්‍ය බොහෝ ප්‍රමාණයක් පැවතීම ය.
(4) කාබනික පොහොර භාවිතයට හුරු වූ ගොවීන් සිටීම ය.

(03) අරංගල විසින් නිෂ්පාදනය කරනු ලබන කාබනික පොහොර අයත්වන නිෂ්පාදන සාධකය වන්නේ,
(1) භූමිය ය. (2) ශ්‍රමය ය. (3) ප්‍රාග්ධනය ය. (4) ව්‍යවසායකත්වය ය.

(04) ඉහත සිද්ධියට අදාළවන නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) අරංගලගේ ව්‍යාපාරයට නීතිමය පුද්ගලභාවයක් ඇත.
(2) වාසනා, අරංගලගේ ව්‍යාපාරයේ හවුල්කරුවෙකි.
(3) ගොවීන් අරංගලගේ ව්‍යාපාරයේ ඇල්මැති පාර්ශවයක් නොවේ.
(4) එළවළු වගාකරන ගොවීන් සිටින ප්‍රදේශයක් වීම, මෙම ව්‍යාපාරයට කදිම අවස්ථාවකි.

(05) හිමිකාරිත්වය අනුව ව්‍යාපාර සංවිධාන නිවැරදිව වර්ගකර ඇති පිළිතුර තෝරන්න.
(1) පෞද්ගලික අංශයේ ව්‍යාපාර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර.
(2) පෞද්ගලික අංශයේ ව්‍යාපාර, රාජ්‍ය අංශයේ ව්‍යාපාර.
(3) රාජ්‍ය අංශයේ ව්‍යාපාර, මහ පරිමාණ ව්‍යාපාර.
(4) ලාභ අරමුණුකරගත් ව්‍යාපාර, ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාර.

(06) ව්‍යාපාරයක ප්‍රධාන අරමුණක් වන්නේ,
(1) රැකියා උත්පාදනය කිරීම යි.
(2) පාරිභෝගික තෘප්තිය ඉහළ නැංවීම යි.
(3) භාණ්ඩවල ගුණත්වය ආරක්ෂා කිරීම යි.
(4) සේවක සුභසාධනය යි.

(07) හවුල් ව්‍යාපාරයක අවම හා උපරිම හවුල්කරුවන් සංඛ්‍යාව තීරණය කර ඇති පනත වන්නේ,
(1) 1890 හවුල් ආඥා පනත ය.
(2) 1918 අංක 06 ව්‍යාපර නාම ආඥා පනත ය.
(3) 1972 - අංක 05 සමූපකාර පනත ය.
(4) 2007 / අංක 07 සමාගම් පනත ය.

(08) සාලිය ජයසිංහ විසින් තම ව්‍යාපාරය ''සාලිය ස්ටෝර්ස්'' නමින් පවත්වාගෙන යයි. මෙම ව්‍යාපාරය ලියාපදිංචිය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) මෙම ව්‍යාපාරය ලියාපදිංචි කිරීමෙන් නෛතික පුද්ගලභාවයක් ලැබේ.
(2) මෙම ව්‍යාපාරයේ නාමය ලියාපදිංචි කිරීම අනිවාර්යය වේ.
(3) මෙම ව්‍යාපාරයේ නාමය ලියාපදිංචි කිරීම අනිවාර්යය නොවේ.
(4) මෙම ව්‍යාපාරය සමාගම් පනත යටතේ ලියාපදිංචි කළ යුතු ය.

**පහත සිද්ධිය ඇසුරෙන් 09 හා 10 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

- ව්‍යාපාර සංවිධානවල ලක්ෂණ පහත දැක්වේ.

A - වගකීම අසීමිත වීම.
B - ගිවිසුමක් පැවතීම.
C - නෛතික පුද්ගලභාවය හිමිවීම.
D - ප්‍රජාතන්ත්‍රවාදී පාලනය.
E - සාමාජික සුභසාධනය.
F - ලියාපදිංචි කළ යුතු නොවීම.

(09) ඒක පුද්ගල ව්‍යාපාරවල ලක්ෂණ වන්නේ,
(1) A හා B. (2) B හා D. (3) A හා F. (4) C හා E.

(10) ශ්‍රී ලංකාවේ ඇති, අවම 10 දෙනෙකුගෙන් ඇරඹිය හැකි ව්‍යාපාර විශේෂයට අදාල ලක්ෂණ ඇතුළත් වන්නේ,
(1) A හා B. (2) C හා D. (3) D හා E. (4) B හා F.

(11) හානියක් සිදු වුවත් නොවුවත් රක්ෂණ මුදල් ලබා ගත හැකිවන රක්ෂණ වර්ගය වනුයේ,
(1) ගිනි රක්ෂණය ය. (2) සොරබිය රක්ෂණය ය.
(3) මුහුදු උවදුරු රක්ෂණය ය. (4) ජීවිත රක්ෂණය ය.

(12) පහත සඳහන් සන්නිවේදන මාධ්‍ය අතරින් විද්‍යුත් සන්නිවේදන මාධ්‍යයක් වන්නේ,
(1) ඩිජිටල් පුවරු ය. (2) වැඩමුළු ය. (3) රැස්වීම් ය. (4) සාකච්ඡා ය.

(13) රථ වාහන ධාවනය සඳහා ''බලය'' ලබා ගැනීමට නව සූර්යබල පද්ධති හඳුන්වා දීම අයත්වන ප්‍රවාහන මූලිකාංගය වන්නේ,
(1) මාර්ගය ය. (2) මාධ්‍යය ය. (3) බලය ය. (4) පර්යන්තය ය.

(14) පහත X තීරුවේ කළමනාකරණ කාර්යයන් ද, Y තීරුවේ එම එක් එක් කාර්යයට අදාළ කටයුතු ද දැක් වේ.

| X | Y |
|---|---|
| I. සැලසුම්කරණය | A- අලෙවි කළමනාකරු සේවකයින්ගේ කටයුතු අධීක්ෂණය |
| II. සංවිධානකරණය | B- 10% කින් විකුණුම් ඉහළ නැංවීමට තීරණය කිරීම |
| III. මෙහෙයවීම | C- විකුණුම් ඉහළ ගිය ප්‍රතිශතය පරීක්ෂා කිරීම |
| IV. පාලනය | D- වෙළඳ සහායකයින් බඳවා ගැනීම |

ඉහත X තීරුවේ සඳහන් කළමනාකරණ කාර්යයන්, Y තීරුවේ කටයුතු සමඟ අනුපිළිවෙළින් ගැලපූ විට නිවැරදි පිළිතුර වනුයේ,

(1) B, A, D හා C (2) B, C, A හා D (3) B, D, A හා C (4) B, D, C හා A

(15) ආයෝජකයෙකු සාමාන්‍ය කොටස්වල ආයෝජනය කිරීමෙන් ලැබෙන ප්‍රතිලාභ හා ස්ථාවර තැන්පතුවක ආයෝජනය කිරීමෙන් ලැබෙන ප්‍රතිලාභ නිවැරදිව පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) ප්‍රාග්ධන ලාභ, ලාභාංශ (2) පොලී, ප්‍රාග්ධන ලාභ
(3) ප්‍රාග්ධන ලාභ, පොලී (4) ලාභාංශ, පොලී

(16) යමුනා තමා ඉතිරිකරගත් මුදලක් ඵලදායී මාර්ගයක ආයෝජනය කිරීමට අදහස් කරන්නීය. ඇයගේ අපේක්ෂා පහත පරිදි වේ.

- ආයෝජනය සඳහා පූර්ණ ආරක්ෂාවක් ලබා ගැනීම.
- අවදානම අඩුවීම.
- මාස තුනක දී ආයෝජන මුදල් ආපසු ගැනීම.

ඉහත අපේක්ෂාවන් සියල්ල ඉටු කර ගැනීමට වඩාත් යෝග්‍ය ආයෝජන මාර්ගය වන්නේ,

(1) සාමාන්‍ය කොටස් මිලදී ගැනීම ය.
(2) භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීම ය.
(3) දේපළ මිලදී ගැනීම ය.
(4) ඉතිරි කිරීමේ ගිණුමක තැන්පත් කිරීම ය.

(17) ව්‍යාපාරික ගනුදෙනුවක් යනු,

(1) මුදලින් මැනිය හැකි හා මුදලින් මැනිය නොහැකි තොරතුරු ය.
(2) ඇල්මැති පාර්ශවවලට තීරණ ගැනීමට හැකි තොරතුරු ය.
(3) භාණ්ඩ හා සේවා අත්පිට මුදලට ලබා ගැනීම ය.
(4) ව්‍යාපරයක් හා වෙනත් පාර්ශව අතර සිදුවන සම්පත් හුවමාරුවක් ය.

(18) පහත දක්වා ඇති ගනුදෙනු අතරින් වත්කම්, හිමිකම්, හා වගකීම් යන සියල්ලට ම බලපෑමක් ඇති කරන ගනුදෙනුව තෝරන්න.

(1) අයිතිකරු රු. 5000 ක මුදලක් පෞද්ගලික ප්‍රයෝජනයට ගැනීම.
(2) ණයහිමියන්ට රු. 15000 ක මුදලක් ගෙවා දැමීම.
(3) රු. 6000 ක බැංකු ණය පොලිය ඇතුළුව රු. 50,000 ක් බැංකු ණය වාරික ගෙවීම.
(4) ණයගැතියන්ගෙන් රු. 5000 ක මුදලක් ලැබීම.

(19) කිසියම් දිනකට ව්‍යාපාරයක ගිණුම්කරණ සමීකරණයේ වටිනාකම් පහත දැක්වේ

| වත්කම් | = | හිමිකම් | + | වගකීම |
|---|---|---|---|---|
| 75,000 | | 50,000 | | 25,000 |

රු. 5000 ක කොමිස් ආදායමක් මුදලින් ලැබූ පසු ගිණුම්කරණ සමීකරණයෙහි අගයන් නිවැරදිව දක්වා ඇති පිළිතුර තෝරන්න.

| | වත්කම් | = | හිමිකම් | + | වගකීම් |
|---|---|---|---|---|---|
| (1) | 80,000 | = | 50,000 | + | 30,000 |
| (2) | 75,000 | = | 50,000 | + | 25,000 |
| (3) | 80,000 | = | 55,000 | + | 25,000 |
| (4) | 70,000 | = | 50,000 | + | 20,000 |

(20) පහත X තීරුවේ ගිණුම් වර්ග ද, Y තීරුවේ එම ගිණුම්වල සටහන් කරන අයිතම ද දැක්වේ.

| X | Y |
|---|---|
| I. වත්කම් ගිණුම | A- දුන්වට්ටම් |
| II. වගකීම් ගිණුම | B- විකුණුම් |
| III. හිමිකම් ගිණුම | C- ලී බඩු |
| IV. ආදායම් ගිණුම | D- ගැනිලි |
| V. වියදම් ගිණුම | E- ණයහිමියෝ |

X තීරුවේ සඳහන් ගිණුම් වර්ග Y තීරුවේ සඳහන් අයිතම සමඟ අනුපිළිවෙළින් ගැලපූ විට ලැබෙන පිළිතුර වනුයේ,

(1) C, E, D, A හා B ය.
(2) C, E, B, D හා A ය.
(3) C, E, D, B හා A ය.
(4) C, E, B, A හා D ය.

(21) ණයගැතියන්ගෙන් රු. 60,000 ක චෙක්පතක් ව්‍යාපාරයට ලැබීම සටහන් කිරීමට අදාළ නිවැරදි ද්විත්ව සටහන තෝරන්න.

(1) මුදල් ගිණුම හර 60,000
ණයගැති ගිණුම බැර 60,000

(2) බැංකු ගිණුම හර 60,000
ණයගැති ගිණුම බැර 60,000

(3) බැංකු ගිණුම හර 60,000
මුදල් ගිණුම බැර 60,000

(4) ණයගැති ගිණුම හර 60,000
බැංකු ගිණුම බැර 60,000

(22) වෙළෙඳ වට්ටම් සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) ණයගැතියන්ගෙන් මුදල් ලැබීමේ දී අඩුකරන වට්ටම් වෙළඳ වට්ටම් ය.
(2) වෙළෙඳ වට්ටම් ලැබෙන්නේ අත්පිට මුදලට භාණ්ඩ විකිණීමෙන් පමණි.
(3) වෙළෙඳ වට්ටම් ගිණුම්ගත නොකරයි.
(4) මුදල් පොතේ වට්ටම් තීරුවේ වෙළෙඳ වට්ටම් සටහන් නොකරයි.

(23) රු. 50,000 ක භාණ්ඩ ණයට විකිණීමට අදාළ නිවැරදි ද්විත්ව සටහන වන්නේ,

(1) ණයහිමි ගිණුම හර - විකුණුම් ගිණුම බැර (2) ණයගැති ගිණුමහර - විකුණුම් ගිණුම බැර

(3) විකුණුම් ගිණුම හර - ණයගැති ගිණුම බැර (4) විකුණුම් ගිණුම හර - මුදල් ගිණුම බැර

(24) විදුලි වියදම් රු. 5,000 ක් අදාළ මූලික පොතෙහි නිවැරදිව සටහන් කර විවිධ වියදම් ගිණුමට වැරදීමකින් හර කර ඇත. මෙම වරද නිවැරදි කිරීමට අදාළ ද්විත්ව සටහන වන්නේ,

(1) විදුලි වියදම් ගිණුම හර රු. 5,000
මුදල් පොත බැර රු. 5,000

(2) විදුලි වියදම් ගිණුම හර රු. 5,000
අවිනිශ්චිත ගිණුම බැර රු. 5,000

(3) විදුලි වියදම් ගිණුම හර රු. 5,000
විවිධ වියදම් ගිණුම බැර රු. 5,000

(4) විවිධ වියදම් ගිණුම හර රු. 5,000
විදුලි වියදම් බැර රු. 5,000

(25) අචිනිගේ ව්‍යාපාරයේ 2019/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පොත්වලින් උපුටාගත් තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

| | |
|---|---|
| ★ ප්‍රාග්ධනය | රු. 500,000 (2019/1/1) |
| ★ විකුණුම් ආදායම් | රු. 100,000 |
| ★ කොමිස් ආදායම් | රු. 25,000 |
| ★ වසරට අදාළ වියදම් | රු. 50,000 |
| ★ ගැනිලි | රු. 10,000 |

2019/12/31 දිනට අචිනිගේ හිමිකම,

(1) රු. 550,000 (2) රු. 565,000 (3) රු. 590,000 (4) රු. 625,000

(26) ව්‍යාපාරයක් පාවිච්චිය සඳහා යන්ත්‍රයක් ණයට මිලදී ගන්නා ලදී. මෙයට අදාළ මූලාශ්‍ර ලේඛනය හා මූලික පොත පිළිවෙළින්,

(1) ගැණුම් ඉන්වොයිසිය හා ගැනුම් ජ'නලය. (2) වවුචරය හා මුදල් පොත.

(3) ජ'නල වවුචරය හා පොදු ජ'නලය. (4) ගැනුම් ඉන්වොයිසිය හා පොදු ජ'නලය.

(27) ව්‍යාපාරයක 2020/01/01 දිනට ව්‍යාපරයේ බැංකු ගිණුමේ ශේෂය රු. 15500 ක් වූ අතර, එදිනට බැංකු ප්‍රකාශයට අනුව ශේෂය රු. 16000 ක් විය. මෙම වෙනසට හේතුවන ගනුදෙනුව තෝරන්න.

(1) බැංකුව විසින් අයකරගත් රු. 500 ක බැංකු ගාස්තු.

(2) බැංකුවට සෘජුව ම ලැබී තිබූ ආයෝජන ආදායම රු. 500.

(3) ස්ථාවර නියෝග මත බැංකුව අයකරගත් රු. 500 ක රක්ෂණ වාරික.

(4) තැන්පත් කළ නමුත් නිශ්කාශනය නොවූ චෙක්පත් රු. 500.

(28) පාන් නිෂ්පාදනය කරන බේකරියක අයිතිකරු විසින් පාන් 10 ක් තම පෞද්ගලික ප්‍රයෝජනය සඳහා ලබාගැනීම සටහන් කරන මූලික පොත වන්නේ,

(1) පොදු ජ'නලය ය. (2) ගැණුම් ජ'නලය ය.

(3) විකුණුම් ජ'නලය ය. (4) සුළු මුදල් පොත ය.

**පහත සඳහන් තොරතුරු ඇසුරින් ප්‍රශ්න අංක 29 හා 30 ට පිළිතුරු සපයන්න.**

- ජයබිම ක්‍රීඩා සමාජයේ සාමාජික සංඛ්‍යාව 200 කි. එක් සාමාජිකයෙකුගේ වාර්ෂික සාමාජික මුදල රු. 100 කි. 2019/12/31 දිනෙන් අවසන් වර්ෂයේ සාමාජිකයන් 20 දෙනෙකු එම වර්ෂය තුළ සාමාජික මුදල් ගෙවා නොතිබුණි නම්,

(29) 2019 වර්ෂයේ ලැබීම් හා ගෙවීම් ගිණුමේ ඇතුළත් කළ යුතු සාමාජික මුදල් ප්‍රමාණය,
(1) රු. 22,000 කි. (2) රු. 2,000 කි. (3) රු. 20,000 කි. (4) රු. 18000 කි.

(30) 2019/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කරන ආදායම් ප්‍රකාශනයේ දැක්විය යුතු නිවැරදි සාමාජික මුදල් ප්‍රමාණය වන්නේ,
(1) රු. 22,000 කි. (2) රු. 18,000 කි. (3) රු. 20,000 කි. (4) රු. 2,000 කි.

**ප්‍රශ්න අංක 31 හා 32 යන ප්‍රශ්නවලට පහත තොරතුරු ඇසුරින් පිළිතුරු සපයන්න.**

- වඩු කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යන සේමිණිගේ ව්‍යාපරයේ 2020 ජනවාරි මාසයේ මුළු සෘජු පිරිවැය රු. 58,000 ක් විය. පොදු කාර්ය පිරිවැය රු. 62,000 ක් විය. පිරිවැය මත 20% ක ලාභාන්තිකයක් තබා ගනිමින් නිෂ්පාදිත අලෙවි කෙරේ. (මෙම ව්‍යාපාරය ජනවාරි මාසයේ නිපදවනු ලබන්නේ ලී මේස 100 ක් පමණි.)

(31) මෙම ව්‍යාපාරයේ පිරිවැය තොරතුරු අනුව එක් ලී මේසයක පිරිවැය වන්නේ,
(1) රු. 5800 (2) රු. 6200 (3) රු. 620 (4) රු. 1200

(32) එක් ලී මේසයක විකුණුම් මිල වන්නේ,
(1) රු. 1440 (2) රු. 1200 (3) රු. 1400 (4) රු. 1250

**ප්‍රශ්න අංක 33 සිට 40 දක්වා ප්‍රශ්නවලට පහත තොරතුරු ඇසුරින් පිළිතුරු සපයන්න.**

- අසංකගේ ව්‍යාපාරයේ 2019/12/31 දිනට ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| විස්තරය | හර (රු) | බැර (රු) |
|---|---|---|
| ගැණුම් | 450,000 | |
| විකුණුම් | | 590,000 |
| ගොඩනැගිලි - පිරිවැයට | 300,000 | |
| උපකරණ - පිරිවැයට | 50,000 | |
| 2019/01/01 දිනට ගොඩනැගිලි ක්ෂය වෙන් කිරීම් | | 30,000 |
| 2019/01/01 දිනට තොගය | 12,000 | |
| දුන් වට්ටම් | 1,000 | |
| ලද වට්ටම් | | 5,500 |
| රක්ෂණය | 5,500 | |
| ප්‍රචාරණය | 25,000 | |
| 15% බැංකු ණය | | 50,000 |
| බැංකු ණය පොලී | 7,500 | |
| ණය ගැතියෝ | 18,000 | |
| ණය හිමියෝ | | 23,000 |
| මුදල් | 29,500 | |
| 2019/01/01 දිනට ප්‍රාග්ධනය | | 200,000 |
| | 898,500 | 898,500 |

අමතර තොරතුරු පහත දැක්වේ.

(i) 2019/12/31 දිනට ඉතිරි බඩු තොගය රු. 12000.

(ii) ණයගැතියන්ගෙන් රු. 2000/- බොල්ණය කපාහැරිය යුතු ය.

(iii) ගොඩනැගිලි හා උපකරණ වාර්ෂිකව පිරිවැය මත 10% බැගින් ක්ෂය කල යුතු ය.

(33) 2019/12/31 දිනෙන් අවසන් වර්ෂයේ ව්‍යාපාරයේ විකුණුම් පිරිවැය වන්නේ,

(1) රු. 450,000 (2) රු. 462,000
(3) රු. 140,000 (4) රු. 474,000

(34) 2019/12/31 දිනෙන් අවසන් වර්ෂයේ ව්‍යාපාරයේ දළ ලාභය වන්නේ,

(1) රු. 590,000 (2) රු. 140,000
(3) රු. 450,000 (4) රු. 462,000

(35) 2019/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙම ව්‍යාපාරය පිළියෙල කරන ආදායම් ප්‍රකාශනයේ දැක්විය යුතු බෙදාහැරීමේ වියදම්වල එකතුව වනුයේ,

(1) රු. 55,000 (2) රු. 30,000
(3) රු. 28,000 (4) රු. 76,000

(36) මෙම ව්‍යාපාරයේ ජංගම වත්කම් පමණක් ඇතුළත්වන පිළිතුර වන්නේ,

(1) ණයහිමියෝ, මුදල් ශේෂය හා ගොඩනැගිලි ය.
(2) ණයගැතියෝ, බැංකු අයිරාව හා මුදල් ශේෂය ය.
(3) අවසන් තොගය, බෙදාහැරීමේ වැන් රථය හා මුදල් ශේෂය ය.
(4) ණයගැතියෝ, මුදල් ශේෂය හා අවසන් තොගය ය.

(37) 2019/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙම ව්‍යාපාරය පිළියෙල කරන ආදායම් ප්‍රකාශනයේ ශුද්ධ ලාභය වන්නේ,

(1) රු. 69,500 (2) රු. 76,000
(3) රු. 78,000 (4) රු. 72,500

(38) 2019/12/31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය වියදම්වල දැක්විය යුතු බැංකු ණය පොලිය වන්නේ,

(1) රු. 7,000 (2) රු. 7,500
(3) රු. 5,000 (4) රු. 5,500

(39) 2019/12/31 දිනට ජංගම නොවන වත්කම්වල ධාරණ අගය කොපමණද?

(1) රු. 290,000 (2) රු. 240,000
(3) රු. 285,000 (4) රු. 250,000

(40) 2019/12/31 දිනට මෙම ව්‍යාපාරයේ හිමිකම වන්නේ,

(1) රු. 269,500 (2) රු. 200,000
(3) රු. 254,500 (4) රු. 224,500

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව බස්නාහිර පළාත් අධ්‍යාපන
மேல் மாகாணக் கல்வித் திணைக்களம் மேல் மாகாணக் கல்வித்
Western Province Education Department Western Province Education

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

**වර්ෂ අවසාන ඇගයීම**
**ஆண்டிறுதி மதிப்பீடு - 2020**
**Year End Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය | පත්‍රය / வினாத்தாள் / Paper: II | කාලය / காலம் / Time: පැය 02 |

සැලකිය යුතුයි:

- පළමුවන ප්‍රශ්නය ඇතුළුව I කොටසින් ප්‍රශ්න **දෙකක්** ද, II කොටසින් ප්‍රශ්න **දෙකක්** ද බැගින් තෝරා ගෙන ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
- පිළිතුරු පැහැදිලි අත් අකුරින් ලියන්න

❖ **පහත සිද්ධිය ඇසුරෙන් අංක (i) සිට (x) දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

(01) උසස් පෙළ ජීව විද්‍යා අංශයෙන් හැදෑරූ අසිත විභාගය අවසන් කිරීමෙන් පසු මාස 06 ක දේශීය ආහාර ද්‍රව්‍ය සැකසුම් පාඨමාලාවක් හදාරණ ලදී. වසංගත රෝග ව්‍යාප්තියත් සමඟ දේශීය නිෂ්පාදන කෙරෙහි ජනතා උනන්දුව ද ඉහළ මට්ටමකට පැමිණ ඇති නිසා ශ්‍රී ලංකාවට ආවේණික තැඹිලි භාවිත කොට තැඹිලි වතුර ටින් කිරීමේ ව්‍යාපාරයක් ''කොකෝ ඩ්‍රින්ක්ස්'' නමින් ආරම්භ කරන ලදී. සෞඛ්‍ය ආරක්ෂිතව නිපදවන ලද මෙම තැඹිලි බීම ටින් සඳහා දේශීය වෙළෙඳපොළ තුළ ඉතා හොඳ ඉල්ලුමක් පවතී.

ව්‍යාපාරයේ 2019 ජනවාරි 01 දිනට පහත ගිණුම් ශේෂ පැවතුණි.

| | රු. |
|---|---|
| මුදල් ශේෂය | 120,0000 |
| උපකරණ | 300,000 |
| ඉඩම් ගොඩනැගිලි | 500,000 |
| ණයගැතියෝ | 50,000 |
| ණය හිමියෝ | 30,000 |

2019 ජනවාරි 31 දිනෙන් අවසන් මාසය තුළ දී පහත ගනුදෙනු සිදුවිය.

- ⋆ තැඹිලි මිලදී ගැණුම් 100000
- ⋆ සේවක වැටුප් ගෙවීම් 20000
- ⋆ ප්‍රවාහන වියදම් 7000
- ⋆ තැඹිලි වතුර ටින් විකුණුම් 200000
- ⋆ ගෙවිය යුතු විදුලි ගාස්තු 3000

අසිතගේ තැඹිලි නිෂ්පාදන සඳහා දේශීය වෙළෙඳපොළේ හොඳ ඉල්ලුමක් පැවති අතර විදේශීය වෙළඳපල සඳහාද අපනයනය ආරම්භ කරීමට ඔහුගේ අපේක්ෂාව විය. මේ සඳහා ව්‍යාපාරය තවදුරටත් පුළුල් කිරීමට අවශ්‍ය නිසා තම මිතුරකු වූ පැතුම් සංජීව ද 2019/02/01 ව්‍යාපාරයට සම්බන්ධ කර ගන්නා ලදී. පැතුම් ද ව්‍යාපාරය පිළිබඳ විශේෂ උනන්දුවක් ඇති පුද්ගලයෙකි. ඔහුගේ අක්කර තුනක තැඹිලි වගාව ද මෙම ව්‍යාපාරයට එක් කරන ලදී.

මෙම ව්‍යාපාරයේ ඉඩම් ගොඩනැගිලි හා උපකරණ යන වත්කම් වාර්ෂිකව ක්ෂය කෙරේ. මාසය අවසානයේ තැඹිලි නිෂ්පාදන කිසිවක් ඉතිරි නොවීය.

(i) (අ) 2019/01/01 දිනට ''කොකෝ ඩ්‍රින්ක්ස්'' ව්‍යාපාරය අයත්වන ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක්ද?

(ආ) මෙම ව්‍යාපාරයේ නිෂ්පාදනය සඳහා යොදා ගන්නා තැඹිලි කුමන නිෂ්පාදන සාධකයට අයත් වේද?

(ii) කොකෝ ඩ්‍රින්ක්ස් ව්‍යාපාරයේ ශක්තීන් දෙකක් ඉහත සිද්ධියෙන් උපුටා ලියන්න.

(iii) (අ) මෙම ''කොකෝ ඩ්‍රින්ක්ස්'' ව්‍යාපාරය ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් ඔබේ අදහස දක්වන්න.

(ආ) ව්‍යාපාර නාමයක් ලියාපදිංචියට අදාල වන පනත කුමක්ද?

(iv) (අ) පැතුම් සංජීව මෙම ව්‍යාපාරයට එක්වීමෙන් බිහිවන නව ව්‍යාපාර සංවිධාන වර්ගයේ වාසි දෙකක් දක්වන්න.

(ආ) ව්‍යාපාරය පුළුල් කිරීමේ දී චෙක්පත් මඟින් ගනුදෙනු සිදු කිරීමට ආරම්භ කළ යුතු ගිණුම් වර්ගය නම් කරන්න.

(v) කොකෝ ඩ්‍රින්ක්ස් ව්‍යාපාරයේ 2019/01/01 දිනට හිමිකම කොපමණද?

(vi) මෙම ව්‍යාපාරයේ 2019/01/31 දිනට ජංගම වගකීම් වල අගය කොපමණද?

(vii) 2019/01/01 දිනට මෙම ව්‍යාපාරයේ ගිණුම්කරණ සමීකරණයට අදාළ තොරතුරු ආදේශ කර දක්වන්න.

(viii) (අ) කොකෝ ඩ්‍රින්ක්ස් ව්‍යාපාරයේ 2019/01/31 දිනට මුදල් ශේෂය ගණනය කරන්න.

(ආ) මෙම ව්‍යාපාරයේ ජංගම නොවන වත්කම් වාර්ෂිකව පිරිවැය මත 12% බැගින් ක්ෂය කෙරේ නම්, එම ක්ෂය ප්‍රමාණය ගණනය කරන්න.

(ix) ඉහත වාර්ෂික ක්ෂය ප්‍රමාණය පොදු ජ'නලයේ සටහන් කරන ආකාරය දක්වන්න (සංලක්ෂ්‍ය සමඟ)

(x) ''කොකෝ ඩ්‍රින්ක්ස්'' ව්‍යාපාරයේ 2019/01/31 දිනට ශුද්ධ ලාභය ගණනය කරන්න.

( ලකුණු $2 \times 10 = 20$)

## I කොටස - ව්‍යාපාර අධ්‍යයනය

❖ **ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.**

(02) (i) (අ) ''නිෂ්පාදන සාධක'' යන්න අර්ථ දක්වන්න.

(ආ) ව්‍යවසායකයා විසින් ඉටුකරන කාර්‍යයන් දෙකක් දක්වන්න.

(ii) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද, අසත්‍ය ද, යන්න දක්වන්න.

(අ) ව්‍යාපාර විසින් පාරිභෝගික රුචිකත්වය, ආදායම් මට්ටම, සමාජ තත්ත්වය යන කරුණු සලකා බලයි. (................)

(ආ) නිෂ්පාදනයේ දී ආධාර කර ගන්නා මිනිසා විසින් සකස් කරන ලද දෑ ව්‍යවසායකත්වය නම් වේ. (................)

(ඉ) ගුණත්වයෙන් ඉහළ භාණ්ඩ ලබා ගැනීම සැපයුම්කරුවන්ගේ අරමුණකි. (................)

(ඊ) යම් රටක ආර්ථික කටයුතු මෙහෙයවීමේ දී අනුගමනය කරන ප්‍රතිපත්ති දේශපාලන පරිසරය නම් වේ. (................)

(iii) චතුරිකා විසින් පාසල් පොත් අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පාසලක් අසල ආරම්භ කළාය. එම ව්‍යාපාරයට ජනක විසින් පොත් සපයන ලදී. ව්‍යාපාරය පුළුල් කිරීම නිසා බණ්ඩාර එහි කළමනාකරු ලෙස බඳවාගත් අතර පාසල් සිසුන් විශාල පිරිසක් දිනපතා පොත්පත් මිලදී ගනිති.

(අ) මෙම සිද්ධියට අදාළව ව්‍යාපාර පරිසරය වර්ග කල හැකි ප්‍රධාන ආකාර දෙක නම් කරන්න.

(ආ) ඉහත (අ) හි ඔබ සඳහන් කළ එක් එක් පරිසර වර්ගයට අදාල උදාහරණ දෙක බැගින් සිද්ධිය ඇසුරින් ලියා දක්වන්න.

(iv) දිගු කාලයක සිට ශ්‍රී ලංකාවේ වෙළෙඳපළේ භාණ්ඩ හා සේවාවල මිල ගණන් ඉහළ යාමක් දක්නට ඇත.

(අ) පොදු මිල මට්ටමේ අඛණ්ඩ ඉහල යාම හඳුන්වන ආර්ථික පරිසර සාධයක නම් කරන්න.

(ආ) ආර්ථික පරිසර සාධකයක් ලෙස විදේශ විනිමය අනුපාතය පැහැදිලි කරන්න.

( ලකුණු 2 × 4 = 8)

(03) (i) (අ) ව්‍යාපාර සංවිධානයක් යන්න නිර්වචනය කරන්න.

(ආ) අරමුණ අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කරන ප්‍රධාන ආකාර දෙක නම් කරන්න.

(ii) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

(අ) ව්‍යාපාරයේ ප්‍රාග්ධන ප්‍රමාණය, සේවක සංඛ්‍යාව යන සාධක පරිමාණය අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කරන නිර්ණායක කිහිපයකි. (................)

(ආ) අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම ඒක පුද්ගල මෙන්ම හවුල් ව්‍යාපාරයකද දක්නට ලැබෙන වාසියකි. (................)

(ඉ) සමූපකාර සංවිධාන රාජ්‍ය අංශයේ ව්‍යාපාර සංවිධානයකි. (................)

(ඊ) රාජ්‍ය සංස්ථාවක් පිහිටුවනු ලබන්නේ පොදු හෝ විශේෂ පනතක් මගිනි. (................)

(iii) යම් වෙළෙඳාමක් තොග වෙළෙඳාමක් ද සිල්ලර වෙළෙඳාමක් ද යන්න තීරණය වන්නේ ගැණුම්කරුගේ චේතනාව මත වේ.

(අ) සිල්ලර වෙළෙඳාම යනු කුමක්ද?

(ආ) තොග වෙළෙඳාමේ ලක්ෂණ දෙකක් ලියන්න.

(iv) පැතුම් සංජීව උත්සාහයෙන් තම ව්‍යාපාර කටයුතු දියුණුකරගත් දක්ෂ ව්‍යාපාරිකයෙකි. වාණිජ බැංකුවක ජංගම ගිණුමක් ද විවෘත කළ ඔහු චෙක්පත් මගින් ගනුදෙනු කිරීම ද සිදු කරයි.

(අ) චෙක්පත් රේඛනය යනු කුමක්ද?

(ආ) චෙක්පතක් රේඛනය කරන ප්‍රධාන ආකාර දෙක නම් කරන්න.

( ලකුණු 2 × 4 = 8)

(04) (i) (අ) අලෙවිකරණ මිශ්‍රය හඳුන්වන්න.

(ආ) ඉලක්ක වෙළෙඳපොළ යනු කුමක්ද?

(ii) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

(අ) පර්යන්තය ප්‍රවාහනයේ මූලිකාංගයකි. (................)

(ආ) ගොඩනැගිලි, යන්ත්‍ර සූත්‍ර, රථ වාහන, බඩු තොග වැනි දේපලට සිදුවිය හැකි අවදානම් ආවරණය කිරීමට ලබාගන්නා රක්ෂණය ආරක්ෂණය නම් වේ. (................)

(ඉ) CEY NET ටෙලර් යන්ත්‍ර (ATM) කාඩ්පත සම්පත් බැංකුව විසින් නිකුත් කරයි. (.............)

(ඊ) පොලිය මාසිකව හෝ කල්පිරුණු පසුව ලබාගත හැක්කේ ස්ථාවර තැන්පතුවල ය. (................)

(iii) ලලනි ජනප්‍රිය ව්‍යාපාරික කාන්තාවකි. ''ලලනි බියුටි සැලෝන්'' 2018/01/01 දින ඇය විසින් ආරම්භ කළාය. ව්‍යාපාරයේ අරමුණු මනාව තීරණය කිරීමත් එම අරමුණු නිසි පරිදි ඉටුකර ගැනීමට ක්‍රියාමාර්ග තීරණය කිරීමටත් ඇය උත්සුක වූවාය. සේවක මණ්ඩලය සඳහා නිවැරදි උපදෙස් ලබාදුන් ඇය ඔවුන්ට නායකත්වය සපයා අරමුණු කරා මෙහෙයවන ලදී.

(අ) ඉහත සඳහන් ''ලලනි බියුටි සැලෝන්'' ව්‍යාපාරය තුළින් ඔබ හඳුනාගත් කළමනාකරණ කාර්යයන් දෙකක් නම් කරන්න.

(ආ) ඉහත ''අ'' හි ඔබ සඳහන් කල කාර්යයන් දෙකට උදාහරණ ලියන්න.

(iv) ආර්ථික සංවර්ධනයක් ළගාකර ගැනීම සඳහා ''ආයෝජනය'' කිරීමට හිමි වන්නේ සුවිශේෂී ස්ථානයකි.

(අ) සමාගමක් විසින් නිකුත් කරන ''කොටසක්'' යන්න හඳුන්වන්න.

(ආ) භාණ්ඩාගාර බිල්පත් මිලට ගැනීමේ ප්‍රයෝජන (ප්‍රතිලාභ) දෙකක් නම් කරන්න.

( ලකුණු 2 × 4 = 8)

## <u>II කොටස - ගිණුම්කරණය</u>

❖ **ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.**

(05) (i) (අ) ගිණුම්කරණයේ අරමුණ කුමක් ද? ( ලකුණු 2 )

(ආ) වගකීමක දැකිය හැකි ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 2 )

(ii) දනන්සූරියගේ ව්‍යාපාරයේ 2020 ජනවාරි මාසයේ මුල් සතිය තුළ සිදු වූ ගනුදෙනු පහත දැක්වේ.

1. රු. 50,000 ක බැංකු ණයක් ලබා ගැනීම.
2. රු. අයිතිකරු පෞද්ගලික ප්‍රයෝජනයට රු. 8000 ක් ව්‍යාපාරයේ මුදලින් ගැනීම.
3. රු. ව්‍යාපාරයේ පාවිච්චිය සඳහා රු. 30,000 ක ලී බඩු මිලට ගැනීම.
4. භාණ්ඩ මිලට ගැණුම් 15000
5. පිරිවැය රු. 4000 ක් වූ භාණ්ඩ රු. 1000 ක ලාභයක් සහිතව අත්පිට මුදලට විකිණීම.

අවශ්‍ය වන්නේ,

(අ) ඉහත එක් එක් ගනුදෙනුව ගිණුම්කරණ සමීකරණයට බලපාන ආකාරය දැක්වීම. (පිළිතුරු සැපයීමට පහත දැක්වෙන ආකෘතිය භාවිත කරන්න.)

| ගනුදෙනුව | වත්කම් | | | හිමිකම් | වගකීම් | |
|---|---|---|---|---|---|---|
| | ලී බඩු | තොග | මුදල් | | බැංකු ණය | ණය හිමියෝ |
| 1/1 ශේෂය | 60,000 | 12000 | 200000 | 262000 | | 10000 |
| 1 | | | +50,000 | | +50,000 | |
| 2 | | | | | | |

( ලකුණු 03)

(ආ) දනන්සූරියගේ ව්‍යාපාරයේ පළමු සතිය අවසානයේ මුළු වත්කම් වල අගය කීයද?

( ලකුණු 01 )

(iii) ධම්මික ගේ ව්‍යාපාරයේ 2020 මාර්තු මාසයට අදාළ ගනුදෙනු පහත දැක්වේ.

| දිනය | ඉ.අ. | සැපයුම්කරු | ඉන්වොයිසියේ ශුද්ධ වටිනාකම |
|---|---|---|---|
| 3/5 | 130 | ගයාන් | 11000 |
| 3/12 | 215 | අසංක | 8750 |
| 3/20 | 300 | රුවන් | 3250 |

අවශ්‍ය වන්නේ,

(අ) මාර්තු මාසයට අදාල ගැණුම් ජ'නලය පිළියෙල කිරීම.

(ආ) අදාල ලෙජර ගිණුම් පිළියෙළ කිරීම. (ලකුණු 04 )

(මුළු ලකුණු 12 )

(06) (i) (අ) ව්‍යාපාරයක් විසින් පවත්වාගත යුතු මූලික පොත් දෙකක් නම් කරන්න.

(ආ) මුදල් පොත තුලින් කාර්යයන් දෙකක් ඉටු වේ. ඒවා නම් කරන්න. (ලකුණු 02 )

(ii) ප්‍රභානිගේ ව්‍යාපාරයේ 2020 ජනවාරි මාසයට අදාල සුළු මුදල් පිළිබඳ තොරතුරු පහත දැක්වේ. මෙම ව්‍යාපාරයේ සුළු මුදල් අග්‍රිමය රු. 2000/- වේ. 2019/12/31 දින අතැති මුදල රු. 150 කි. මාසය තුල සිදු වූ සුළු වියදම් මෙසේය.

| | | |
|---|---|---|
| 1/5 | තැපැල් ගාස්තු | 80 |
| 1/12 | ගෙන ඒමේ කුලී | 400 |
| 1/16 | ලිපි ලියාපදිංචි ගාස්තු | 120 |
| 1/20 | කාර්යාල පුටු මිලට ගැණුම් | 900 |
| 1/25 | සංග්‍රහ වියදම් | 200 |
| 1/30 | විවිධ වියදම් | 200 |

අවශ්‍ය වන්නේ,

1. 2020/01/01 දිනට ප්‍රධාන මුදල් භාරකරු විසින් අග්‍රිමය ප්‍රතිපූර්ණය කරන වටිනාකම දක්වන්න.
2. 2020/01/31 දිනට ''ලෙජ ගිණුම්'' තීරුවේ වියදම්වල එකතුව කීයද? (ලකුණු 02)

(iii) උදිත ගේ ව්‍යාපාරයේ 2020/06/01 දිනට බැංකු ගිණුමේ තිබූ ශේෂය රු. 60,000 ක් විය. ජුනි මාසය තුළ දී ඔහුගේ ජංගම ගිණුම සමඟ සිදු කළ ගනුදෙනු පහත දැක්වේ.

තැන්පත් කිරීම්

| | |
|---|---|
| 6/2 | මුදල් රු. 18,000 |
| 6/12 | චෙක් තැන්පතු රු. 20,000 |
| 6/25 | චෙක් තැන්පතු රු. 16,000 |

චෙක්පත් නිකුත් කිරීම්

| | |
|---|---|
| 6/4 | ණය හිමියෙකු වූ සඳමාලිට රු. 8,000 |
| 6/12 | වැටුප් ගෙවීම් රු. 12,000 |
| 6/18 | විදුලි ගාස්තු රු. 6,000 |
| 6/27 | ගැණුම් සඳහා රු. 26,000 |

ඉහත ගනුදෙනු බැංකු ගිණුමේ සටහන් කොට එය තුලනය කිරීම. ( ලකුණු 04)

(iv) පහත දැක්වෙන්නේ රුවන් ගේ ව්‍යාපාරයේ 2020 ජනවාරි මාසයේ බැංකු ගිණුම සහ බැංකු ප්‍රකාශනය වේ.

**රුවන් ගේ ව්‍යාපාරයේ**

**2020 ජනවාරි බැංකු ගිණුම**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1/1 | ශේෂය ඉ/ගෙ | | 15000 | 1/2 | ලලිත් (30) | | 5000 |
| 1/5 | මුදල් (චෙ.40) | | 4000 | 1/4 | පියල් (31) | | 2000 |
| 1/15 | මුදල් (චෙ.75) | | 2500 | 1/6 | සමන් (32) | | 3000 |
| 1/20 | මුදල් (චෙ.45) | | 3200 | 1/10 | කමල් (33) | | 8000 |
| 1/29 | මුදල් (චෙ.48) | | 1300 | 1/25 | නිමල් වැටුප් (34) | | 4000 |
| 1/30 | මුදල් (චෙ.34) | | 4800 | 1/31 | ශේෂය ප/ගෙ | | 8800 |
| | | | 30800 | | | | 30800 |

**බැංකු ප්‍රකාශනය**

| දිනය | විස්තරය | හර | බැර | ශේෂය |
|---|---|---|---|---|
| 1/1 | ශේෂය ඉ/ගෙ | | | 15000 |
| 1/4 | චෙ.අ. 30 ලලිත් | 5000 | | 10000 |
| 1/7 | චෙක් තැන්පත් (40) | | 4000 | 14000 |
| 1/17 | චෙක් තැන්පත් (75) | | 2500 | 16500 |
| 1/18 | චෙ.අ. 31 පියල් | 2000 | | 14500 |
| 1/20 | චෙ.අ. 32 සමන් | 3000 | | 11500 |
| 1/22 | චෙක් තැන්පත් (45) | | 3200 | 14700 |
| 1/23 | බැංකු ගාස්තු | 700 | | 14000 |
| 1/24 | ගෙවල් කුලී | 4000 | | 10000 |
| 1/26 | ජනක | | 10000 | 20000 |

අවශ්‍ය වන්නේ,

1. 2020/1/31 දිනට බැංකු ගිණුම සංශෝධනය කිරීම.
2. 2020/1/31 දිනට බැංකු සැසඳුම පිළියෙල කිරීම. (ලකුණු 04 )

( මුළු ලකුණු 12)

(07) (i) (අ) ලාභ හෝ අලාභ ප්‍රකාශනය පිළියෙල කර ලාභය හෙවත් මෙහෙයුම් ප්‍රතිඵලය ගණනය කරන පියවර 02 නම් කරන්න.

(ආ) බොල් ණය ගිණුම්ගත කිරීමට අදාල ද්විත්ව සටහන ලියන්න. (ලකුණු 02)

(ii) ළමා පුටු නිෂ්පාදනය කරන ව්‍යාපාරයක 2019 ජනවාරි මාසය සඳහා තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

- ⋆ නිෂ්පාදන ඒකක ගණන 100
- ⋆ ඍජු වියදම් රු. 40000
- ⋆ පුටු ප්‍රවාහන වියදම් රු. 5000
- ⋆ ඒකකයක නිෂ්පාදන පිරිවැය රු. 500
- ⋆ විකුණුම් මිල තීරණය කිරීමේදී පිරිවැය මත 25% ලාභාන්තිකයක් තබා ගැනේ.

අවශ්‍ය වන්නේ,

(අ) 2019 ජනවාරි මාසය සඳහා නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය.

(ආ) ඒකකයක විකුණුම් මිල (ලකුණු 02)

(iii) චන්දනීගේ ව්‍යාපාරයේ 2019/12/31 දිනට ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| | හර (රු) | බැර (රු) |
|---|---|---|
| ඉඩම් ගොඩනැගිලි | 500000 | |
| යන්ත්‍රසූත්‍ර (පිරිවැයට) | 300000 | |
| යන්ත්‍රසූත්‍ර ක්ෂය වෙන් කිරීම් (2019/01/01 දිනට) | | 30000 |
| 2019/01/01 දිනට තොගය | 50000 | |
| විකුණුම් | | 400000 |
| ගැණුම් | 120000 | |
| ලද වට්ටම් | | 3000 |
| දුන් වට්ටම් | 2000 | |
| ගෙනෙඒමේ කුලී | 6000 | |
| 10% බැංකු ණය | | 120000 |
| වැටුප් හා වේතන | 8000 | |
| ණයගැතියෝ | 15000 | |
| ණයහිමියෝ | | 12000 |
| ප්‍රචාරණ ගාස්තු | 4000 | |
| පැටවුම් කුලී | 2000 | |
| ගෙවූ බැංකු ණය පොලී | 6000 | |
| විදුලි ගාස්තු | 5000 | |
| වරිපනම් හා රක්ෂණ | 3000 | |
| ප්‍රාග්ධනය | | 465000 |
| මුදල් ශේෂය | 9000 | |
| | 1030,000 | 1030,000 |

- අමතර තොරතුරු
  - ⋆ 2019/12/31 දිනට තොගය රු. 35000
  - ⋆ යන්ත්‍රසූත්‍ර සරලමාර්ග ක්‍රමයට වාර්ෂිකව 10% බැගින් ක්ෂය කෙරේ.
  - ⋆ ණයගැතියන්ගෙන් 10% ක් බොල්ණය ලෙස කපා හැරීමට තීරණය කරන ලදී.

අවශ්‍ය වන්නේ

(අ) 2019/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශය. (ලකුණු 04)

(ආ) 2019/12/31 දිනට මූල්‍යතත්ව ප්‍රකාශය. (ලකුණු 4)

(මුළු ලකුණු 12)